2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සීමා නිර්ණය කොමිෂන් සභාව

වැය ශීර්ෂය - 025

අන්තර්ගතය

1.	ආයතනික පැතිකඩ	1-4
2.	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	5-7
3.	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	8-18
4.	කාර්ය සාධන දර්ශක	19
5.	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	19
6.	මානව සම්පත් පැතිකඩ	20
7.	අනුකූලතා වාර්තාව	21-26

1. ආයතනික පැතිකඩ

1.1 හැදින්වීම

ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(1) ව්‍යවස්ථාව අනුව, ගරුජනාධිපතිතුමා විසින් 2023.05.19 දින, වසර තුනක කාලයක් සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාව පත් කරන ලදී. එහි සභාපති හා සාමාජික ලෙස ආචාර්ය කේ. තවලිංගම් මහතා ද සෙසු සාමාජිකයන් දෙදෙනා ලෙස ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මිය සහ එම්.අයි.අමීර් මහතා ද පත් කරන ලදී.

සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යාලය, සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ, දෙවන මහලේ ස්ථාපිත කර ඇති අතර, එහි ලිපිනයසීමා නිර්ණය කොමිෂන් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ල, තැ.පෙ.506, කොළඹ-05 වේ.

සීමා නිර්ණය කොමිෂන් සභාව පත් කිරීම, බලතල හා කාර්ය භාරය පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ආ ව්‍යවස්ථාවට අනුව උක්ත ප්‍රතිපාදන මෙසේය.

41 ආ

(1) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස හෝ ජනාධිපතිවරයා විසින් තැනැත්තෙකු පත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත හැර, නොකරනු ලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන, එකී යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(3)මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා අවස්ථාව එළඹෙන කවර හෝ විටෙක එසේ පත් කරනු ලැබිය යුතු නිසි සහ යෝග්‍ය තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම සභාවේ කාර්යයක් වන අතර ඒ නිර්දේශ වලින් ස්ත්‍රී පුරුෂභාවය ඇතුළුව ශ්‍රී ලාංකිය සමාජයේ බහුත්ත්ව ස්වභාවය පිළිබිඹු වන බව වගබලා ගැනීමට ප්‍රයත්න දරනු ලැබිය යුත්තේය. ඒ කොමිෂන් සභාවල සභාපතිවරුන් සම්බන්ධයෙන් වන විට, පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් තැනැත්තන් තිදෙනකු නිර්දේශ කරනු ලැබිය යුතු අතර,නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේය.

(4) පත් කිරීම් සඳහා සභාවේ නිර්දේශය ලැබුණු දින සිට දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් පත් කරනු ලැබිය යුත්තේය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන යම් තැනැත්තෙකු හෝ කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයෙකු ලෙස වැඩ බැලිම සඳහා පත් කරනු ලබන තැනැත්තකු , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන වල සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුත්තේය. එවැනි විධිවිධානයක් නොමැති අවස්ථාවකදී ඒ තැනැත්තා සභාවේ පූර්ව අනුමැතිය ඇතිව පමණක් ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේය.

(6) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේය.

උප ලේඛනය

(අ) මැතිවරණ කොමිෂන් සභාව

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව

(ඈ) විගණන සේවා කොමිෂන් සභාව

(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කිරීමේ කොමිෂන් සභාව

(උ) මුදල් කොමිෂන් සභාව

(ඌ)සීමා නිර්ණය කොමිෂන් සභාව

(එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

95.

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම ආරම්භ වීමෙන් පසුව මාස තුනක් ඇතුළත, මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේය. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන දේශපාලන කටයුතු වල නිරතව නොසිටින්නා වූ තැනැත්තන් වශයෙන් ජනාධිපතිවරයා සලකන්නා වූ තැනැත්තන් තුන් දෙනෙකුගෙන් ඒ කොමිෂන් සභාව සමන්විත විය යුත්තේ ය.ඔවුන් අතුරෙන් එක් තැනැත්තෙකු එම කොමිෂන් සභාවේ සභාපතිධුරයට ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේය.

(2) සීමා නිර්ණය කොමිෂන් සභාවේ යම් කිසි සාමාජිකයෙකු මිය ගියහොත් නැත්නම් ඉල්ලා අස් වුවහොත්, එසේත් නැත්නම් යම්කිසි සාමාජිකයෙකුට ඒ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් සිය කාර්තව්‍යය යථා පරිදි ඉටුකළ නොහැකි යැයි ජනාධිපතිවරයා විශ්වාස කරන්නේ නම් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තෙකු පත් කළ යුත්තේය.

96.

(1) සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව විස්සකට අඩු නොවූ ද විසි පහකට වැඩි නොවූද , මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදා ඒ එක් එක් කොට්ඨාසයට නමක් ද දිය යුත්තේය.

(2) ශ්‍රී ලංකාවේ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාසයක් ලෙස සමන්විත විය හැක්කේය. නැතහොත් ඒ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාස දෙකකට හෝ වැඩි සංඛ්‍යාවකට බෙදිය හැක්කේය.

(3) පළාතක් මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදනු ලබන අවස්ථාවකදි, හැකිතාක් දුරට ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසය පරිපාලන දිස්ත්‍රික්කයක් හෝ පරිපාලන දිස්ත්‍රික්ක දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවක් හෝ වන බවට නැතහොත් මැතිවරණ කොට්ඨාස දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවකින් පරිපාලන දිස්ත්‍රික්කයක් සමන්විත වන බවට වග බලාගනු පිණිස, සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් , එවකට පවත්නා පරිපාලන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගත යුත්තේය.

(4) එක් එක් පළාතේ මැතිවරණ කොට්ඨාස වලට (ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාම ලේඛනයේ නම් දැක්වෙන ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව අනුසාරයෙන් තෝරාපත් කිරිමට හිමිකම ඇති මන්ත්‍රිවරයන් සංඛ්‍යාවට අමතරව) එක්ව මන්ත්‍රිවරයන් සිව් දෙනෙකු තෝරාපත් කිරිමට හිමිකම ඇත්තේය. එම හිමිකම සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් එම මැතිවරණ කොට්ඨාස අතර සාධාරණව බෙදිය යුත්තේය.

(5) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර මත භේදයක් ඇතිවුවහොත් ඒ සාමාජිකයන් අතරෙන් වැඩි දෙනාගේ මතය බල පැවැත්විය යුතු අතර , එය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලකෙන්නේය. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් සියලු දෙනාම එකිනෙකට වෙනස් මත දරත් නම් , කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මතය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලකෙන්නේය. ඒ තීරණයට එකඟ නොවන සාමාජිකයෙක් වෙයිනම් ඔහු එසේ එකඟ නොවීමට හේතු ද දැක්විය හැක්කේය.

(6) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ තීරණය ද , ඒ තීරණය ට එකඟ නොවන සාමාජිකයෙකු විසින් හේතු දක්වා ඇතොත් ඒ හේතු ද ජනාධිපතිවරයාට දැන්විය යුත්තේය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

සදාචාරාත්මක හා සාධාරණ මුලධර්ම මත සීමා නිර්ණය කිරීමෙහි විශිෂ්ඨත්වය ලබා ගැනිම.

මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබ් ඇති පරිදි ස්වාධින ලෙස , සදාචාරාත්මක ලෙස , සාධාරණ ලෙස , කාර්යක්ෂමව , පාරදෘෂ්‍යභාවයෙන් යුතුව විශ්වසනීය ලෙස හා නීතියට අනුකූලව සීමා නිර්ණය කිරිම.

අරමුණු

- සෑම ඡන්ද දායකයෙකුටම හෝ පුරවැසියෙකුටම සමාන ඉහළම ප්‍රමාණයෙන් සමාන නියෝජනයක් ලැබෙන පරිදි හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම් හා එම වාතාවරණය සුරක්ෂිත වන ලෙස හා කාර්යක්ෂම ලෙස තහවුරු කිරිම සඳහා මැතිවරණ කොට්ඨාස හා වෙනත් පරිපාලන ඒකක සීමාවන් නිර්ණය කිරිම.
- මැතිවරණ කොට්ඨාස හෝ පරිපාලන ප්‍රදේශ හෝ අධ්‍යාපන , සෞඛ්‍ය හෝ ආරක්ෂක වැනි සමාජ-ආර්ථික සේවාවන් සඳහා නිර්ණය කිරිමට භාරදෙන, සීමා නිර්ණයන් නියමිත කාල රාමුව තුල නිම කිරිම.
- රජයට හා වෙනත් ආයතන වලට ස්වකීය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සීමා නිර්ණයන්හිදි අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දිම.
- සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා අදාළ ලියකියවිලි එක් රැස්කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- නිදහස්, සාධාරණ හා විශ්වසනීය ඡන්ද විමසීම් සඳහා නියමානුකූල, නිවැරදි, සාධාරණ සීමා නිර්ණය ක්‍රියාවලියක් අත්‍යවශ්‍ය බව පුරවැසියන්, දේශපාලන පක්ෂ ඇතුළු සියළු පාර්ශවයන් දැනුම්වත් කිරීම.

1.3 ප්‍රධාන කාර්යභාරය හා බලතල

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථා වලින් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් දැක්වේ. එසේ වුවද මෙම සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් එහි කාර්යභාරයන් හා බලතල යන කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවේ.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරන අවස්ථාවේදී හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කරන අවස්ථාවේදී තනි සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවීමට හා එහි වගකීම් භාරය විස්තර කරන විට සියලුම භූගෝලීය සීමා මායිම් නිර්ණය කිරීම න්‍යායානුගත කිරීමට කටයුතු කළ යුතුව ඇත. මේ සඳහා කොමිෂන් සභාව වෙත බලතල පැවරීමේ පනතක් සම්මත කළ යුතු අතර, එය දැනට, කෙටුම්පත් කර ඉදිරි කටයුතු සඳහා ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.

1.4 සංවිධාන සටහන



2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සීමා නිර්ණය කොමිෂන් සභාවේ රැස්වීම්:-2025.01.01 වන දින සිට 2025.12.31 දින දක්වා පරිපාලන හා ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීම සඳහා රැස්වීම්12ක් පවත්වා ඇත.

13 වැනිරැස්වීම - 2025.01.16	19 වැනිරැස්වීම- 2025.07.28
14 වැනිරැස්වීම - 2025.02.17	20 වැනිරැස්වීම- 2025.08.19
15 වැනිරැස්වීම - 2025.03.17	21 වැනිරැස්වීම - 2025.09.22
16 වැනිරැස්වීම - 2025.04.30	22වැනිරැස්වීම- 2025.10.14
17 වැනිරැස්වීම - 2025.05.20	23වැනිරැස්වීම- 2025.11.11
18 වැනිරැස්වීම - 2025.06.24	24වැනිරැස්වීම- 2025.12.16

2.2 ආයතනික කටයුතු

කොමිෂන් සභාවේ සියලුම නිලධාරින්ගේ ආයතනික කටයුතු වලට අදාලව නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම ඇතුළු සියලුම ආයතනික කටයුතු සිදු කිරීම, කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ආයතනික කටයුතු ඉටු කිරීම,කොමිෂන් සභාව සතු මෝටර් රථ 02 ට අදාල ලිපිගොනු කටයුතු සිදු කිරීම, ඉන්ධන අත්තිකාරම් ලේඛනය පවත්වාගෙන යාම, නිවාඩු ලිපිලේඛන පවත්වාගෙන යාම හා කාර්යාල උපකරණ අළුත්වැඩියාවට අදාල ලේඛන පවත්වාගෙන යාම සිදු කරයි.

මීට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, විගණන සේවා කොමිෂන් සභාව, සහ වාර්තා ඉදිරිපත් කල යුතු වෙනත් ආයතන වෙත ලබාදිය යුතු වාර්තා නියමිත දිනට ලබා දීම සිදු කරයි.

2.3 මූල්‍ය පරිපාලනය

සියලුම ගෙවීම් කටයුතු නිසි නිර්දේශයකින් හා අනුමැතියකින් යුතුව මුදල් රෙගුලාසි අනුව නිසි පරිදි සිදු කල අතර ප්‍රසම්පාදන කටයුතුද, භාණ්ඩ සමීක්ෂණ කටයුතුද නිසියාකාරයෙන් ක්‍රියාත්මක කර ඇත. මහා භාණ්ඩාගාරය විසින් ඉල්ලා ඇති සියලුම වාර්තා හා තොරතුරු නිසි අයුරින් ලබා දීමද සිදු කර ඇත.

තවද ජාතික විගණන කොමිෂන් සභාව විසින් ඉල්ලා ඇති වාර්තා නියමිත පරිදි ලබා දීමට කටයුතු කර ඇති අතර විගණන විමසුම් වලටද නිසි පරිදි පිළිතුරු සපයා ඇත.

2.4 ක්‍රියාකාරකම්

2.4.1 සීමා නිර්ණය කාර්යය සම්බන්ධයෙන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවදැනුම්වත් කිරීම සඳහා තොරතුරු පත්‍රිකා සකස් කිරීම

සීමා නිර්ණය සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ඉංග්‍රිසි භාෂාවෙන් අත්පොත් 4ක් මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණි. මේ යටතේ අත් පොත් 03ක් පහත සඳහන් අයුරින් කටයුතු සකස් කෙරින.

i) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳව කරුණු ඇතුළත් පොතක් "Evolution of Parliamentary System in Sri Lanka" කොමිෂන් සභා සාමාජිකයන් විසින් ඉංග්‍රිසි භාෂාවෙන් සකස් කර සීමිත පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. මෙය සිංහල හා දෙමළ භාෂා වලින් ද සකස් කිරීමට යෝජිතය.

ii) සීමා නිර්ණය කාර්යයන් සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ පරිපාලන කොට්ඨාස පිළිබඳව “Administrative Unit in Sri Lanka” නමින් ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රශ්නෝත්තර පත්‍රිකාවක් කොමිෂන් සභා සාමාජිකයන් විසින් සකස් කරන ලද අතර, එය සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීමට බලාපොරොත්තුවේ. දැනට ඉංග්‍රීසි භාෂාවෙන් සීමිත පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත.

iii). “Evolution of Local Government and Ward Base Delimitation in Sri Lanka”නමින් ශ්‍රී ලංකාවේ පළාත්පාලන ක්‍රමය සහ කොට්ඨාස සීමා නිර්ණය පිළිබඳ කරුණු ඇතුළත් පොතක් ඉංග්‍රීසි භාෂාවෙන් සීමිත පිටපත් සංඛ්‍යාවක් මුද්‍රණය කරන ලදී. සිංහල හා දෙමළ පරිවර්තනයන් කිරීමට ද යෝජිතය.

2.4.2 සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.

සීමා නිර්ණය කොමිෂන් සභාවේ තොරතුරු මහජනතාවට දැන ගැනීම සඳහා වෙබ් අඩවියක් මෙතෙක් නොතිබූ අතර, 2025 ජූලි මාසයේ දී අවම පිරිවැයක් දරා වෙබ් අඩවියක් සකස් කරන ලදී.මේ වන විට කොමිෂන් සභාව පිළිබඳ තොරතුරු හා විවිධ ශාස්ත්‍රීය තොරතුරු එයට උඩුගත කිරීමට කටයුතු කර ඇත. එහි ලිපිනය http//delimitationcommission.blogspot.com වේ.

2.4.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී වසම් මායිම් සංශෝධනය පිළිබඳව 2012 හා 2021 සීමා නිර්ණය කමිටු නිර්දේශ නැවත සමාලෝචනය කිරීම.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී වසම් සංශෝධනය පිළිබඳව 2012 සහ 2021 වර්ෂයන් හි අදාළ කමිටු විසින් කරන ලද නිර්දේශ නැවත සලකා බැලීම සඳහා කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලයතීරණය කර ඇති අතර, ඒ පිළිබඳව මූලික සාකච්ඡාවක් ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා විසින් කැඳවනු ලදුව 2025.08.19 දින පාර්ලිමේන්තුවේ දී පැවැත්විණ. ඒ සඳහා කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන් ද ලේකම්වරයා ද සහභාගී විය. එහිදී සාකච්ඡා වූ කරුණු අනුව, 2012 හා 2021 සීමා නිර්ණය කමිටු නිර්දේශ නැවත අධ්‍යයනය කිරීමේ කටයුතු වල කොමිෂන් සභා සාමාජිකයින් නිරතව සිටී.

2.4.4 2025 ජන හා නිවාස සංගණනයේ දත්ත එක් රැස් කර අවශ්‍ය පරිදි සකස් කිරීම.

2025 ජන හා නිවාස සංගණනයේ මෙතෙක් නිකුත් කර ඇති දත්ත, ඉදිරි සීමා නිර්ණය කටයුතු සඳහා පහසුවෙන් යොදා ගැනීමට හැකිවන පරිදි සකස් කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

2.4.5 මැතිවරණ කොමිෂන් සභාවේ “ වාර්ෂික පර්යේෂණ සැසිය - 2025” සඳහා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම.

2025 නොවැම්බර් මස 04 වැනි දින පැවති මැතිවරණ කොමිෂන් සභාවේ “ වාර්ෂික පර්යේෂණ සැසිය- 2025 ” (Annual Research Symposium – 2025) සඳහා ඉංග්‍රීසි හා දෙමළ භාෂා මාධ්‍යයෙන් පර්යේෂණ පත්‍රිකා 02ක් ඉදිරිපත් කරන ලදී.

i). සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති ආචාර්ය කේ. තවලිංගම් මහතා සහ සාමාජික එම්.අයි.අමීර් මහතා විසින් සකස් කරන ලදී. දෙමළ භාෂාවෙන් “இலங்கையில் பாரானளுமன்ற அரசியலில்பெண்கள் வகிபாகம்” ලෙස ඉදිරිපත් කළ එම පත්‍රිකාව පර්යේෂණ සැසියේ දී ඉදිරිපත් කිරීම සඳහා තෝරා ගන්නා ලද අතර, සභාපතිතුමා විසින් එම ඉදිරිපත් කිරීම කරන ලදී.

ii).සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති ආචාර්ය කේ. තවලිංගම් මහතා සහ සාමාජික ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මිය විසින් සකස් කරන ලදී. ඉංග්‍රීසි භාෂාවෙන් “Women’s Political Participation : Ideals, Realities and Challenges” ලෙස සකස් කළ එම පත්‍රිකාව පර්යේෂණ සභරාවේ පල කිරීම සඳහා තෝරා ගන්නා ලදී.

2.5 සම්පත් කේන්ද්‍රය

සීමා නිර්ණය විෂයට අදාල වන මුද්‍රිත හා විද්‍යුත් ලිපි ලේඛනයන් එකතුව පුළුල් කිරීමේ ක්‍රියාවලියෙහි කොමිෂන් සභාව අඛණ්ඩව නිරතව සිටී. සීමා නිර්ණයට අදාල ගැසට් නිවේදන, වාර්තා හා වෙනත් ලිපි ලේඛණ පිටපත් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාම නිලධාරී කොට්ඨාස තුළ සිතියම් ඉල්ලා සිටින පාර්ශවයනට ලබා දීමට ද කොමිෂන් සභාව සූදානම්ව සිටී.

බී.පී.සී.කුලරත්න
ලේකම් (වැ.බ.)
සීමා නිර්ණය කොමිෂන් සභාව

3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	කතය 2025 රු.	2024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		18,216,105	15,240,000	ඒසීඒ-3
-	තැන්පතු		33,655	29,325	ඒසීඒ-4
250,000	අත්තිකාරම් ගිණුම		303,688	246,488	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**18,553,448**	15,515,813	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**18,553,448**	15,515,813	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		40,038	140,142	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		18,513,410	15,375,671	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ-2(ii)
12,875,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	12,684,123	11,148,485	
5,825,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	4,941,551	4,238,557	
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	-	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
18,700,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**17,625,673**	15,387,042	
	මූලධන වියදම්				ඒසීඒ-2(ii)
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
300,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	223,610	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
-	හැකියා වර්ධනය	14	-	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
300,000	**මුළු මූලධන වියදම් (උ)**		**223,610**	-	
	තැන්පතු ගෙවීම්		33,655	29,325	ඒසීඒ-4
1,000,000	අත්තිකාරම් ගෙවීම්		994,944	286,394	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,028,599	315,719	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		18,877,882	15,702,761	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(364,472)	(327,090)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(364,472)	(327,090)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසීඒ-3
			(364,472)	(327,090)	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,884,516	2,660,906
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	1,494,282	803,026
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**4,378,798**	**3,463,932**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		1,494,282	803,026
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,884,516	2,660,906
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**4,378,798**	**3,463,932**

පිටු අංක..........සිට .... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක .... සිට .... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : බී. පී. සී. කුලරත්න
තනතුර :ලේකම්
දිනය : 2026.02.27

බී. පී. සී. කුලරත්න
ලේකම් (වැබ)
සීමා නිර්ණය කොමිෂන් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ල
කොළඹ - 05

....
ගණන්දීමේ නිලධාරි
නම :ඊ. ජී. එස්. සිසිරකුමාර
තනතුර :ගණකාධිකාරී
දිනය : 2026.02.27

ඊ.ජී.එස්. සිසිර කුමාර
ගණකාධිකාරී
සීමා නිර්ණය කොමිෂන් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ල
කොළඹ - 05

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තතය 2025 රු.	සංශෝධිත 2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	365,021	256,140
අග්‍රිම ලැබීම්	18,216,105	15,240,000
අත්තිකාරම් අයකර ගැනීම්	303,688	246,488
තැන්පතු ලැබීම්	33,655	29,325
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**18,918,469**	**15,771,953**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	17,560,773	15,290,092
සහනාධාර සහ මාරුකිරීම්	-	-
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	223,610	
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	65,449	26,000
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	40,038	140,142
අත්තිකාරම් ගෙවීම්	994,944	286,394
තැන්පතු ගෙවීම්	33,655	29,325
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**18,918,469**	**15,771,953**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	-	-
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	-	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) **පිළියෙල කිරීමේ අරමුණ**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) **මුදල් හා මුදල් සමාන දෑ**

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන(රු.)		
පුනරාවර්තන	18,700,000.00	18,700,000.00	17,560,773.16	93.91%
ප්‍රාග්ධන	300,000.00	300,000.00	223,610.00	75%

3.7 මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම කොමිෂන් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත (රු.)	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	2,884,516.45	2,884,516.45	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	PIC/B/DC/2/25/1	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2026 මැයි 20 දින

DELIMITATION COMMISSION
22 MAY 2026
COLOMBO - 05

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,

සීමා නිර්ණය කොමිෂන් සභාව

ශීර්ෂය - 025 සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

කේ.කේ.එස්.ජයකොඩි

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. PIC/B/DC/2/25/1

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 මැයි 20 දින

DELIMITATION COMMISSION 22 MAY 2026 COLOMBO - 05

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
සීමා නිර්ණය කොමිෂන් සභාව

ශීර්ෂය 025 - සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 025 - සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව සීමා නිර්ණය කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සීමා නිර්ණය කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම්

හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.6.1 අග්‍රිම ශේෂය

(අ) ACA-3 ආකෘතියේ අග්‍රිම ලැබීම ලෙස රු.18,216,105 ක වටිනාකමක් දක්වා තිබුණද CIGAS පරිගණක පද්ධතිය මගින් ලබාගෙන ඇති දෙපාර්තමේන්තු ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු.18,211,000 ක් වූයෙන් රු.5,105 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2025 මාර්තු මාසයට අදාලව වෙනත් මූලාශ්‍ර වලින් අග්‍රිම ලැබීම් රු.30,105 ක් වුවද ACA-3 ආකෘතියේ එම ශේෂය දක්වා නොතිබුණි.

(ඇ) ACA-3 ආකෘතියේ මුදල් මඟින් අග්‍රිම පියවීම ලෙස රු. 40,038 ක වටිනාකමක් පෙන්වා තිබුණද 2025 වර්ෂයට අදාල හර නිවේදනය අනුව හා CIGAS පරිගණක පද්ධතිය මගින් ලබා ගන්නා ලද ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු.65,038 ක් වූයෙන් රු.25,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමණාකරණය

රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙළ කර නොමැති වීම හේතුවෙන් වැය විෂයන් 11 ක සියයට 6 සිට සියයට 100 දක්වා ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර නොතිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ)	2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 10 වගන්තිය	ඉකුත් වර්ෂයට අදාල තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වාර්ෂික වාර්තාව 2025 දෙසැම්බර් 31 දින දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.
(ආ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය	යොමුගත චක්‍රලේඛය අනුව කොමිෂන් සභාව සතුව පවතින වාහන දෙකක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 261 (2) වගන්තිය	චෙක්පත් මඟින් ගෙවීම් කිරීමේදී චෙක්පතේ අංකය වවුචරයේ මෙන්ම මුදල් පොතේ නියමිත සටහන ඉදිරියෙන් සටහන් කල යුතු වුවද ඉන් බැහැරව කටයුතු කල අවස්ථා 80 ක් විගණනයේදී නිරීක්ෂණය විය.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුතු කොමිෂන් සභා රැස්වීම් 12 ක් 2025 වර්ෂය තුලදී පවත්වා තිබුණද කොමිෂන් සභාවේ අරමුණු ඉටුකිරීමට අදාල ක්‍රියාමාර්ග එම රැස්වීම් තුලදී සාකච්ඡා වී නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරී සැලැස්ම.

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව මාර්ගෝපදේශයේ සඳහන් ආකෘතියට අනුකූල වන ලෙස, වගකීම් ක්ෂේත්‍ර, ක්‍රියාකාරකම්, ප්‍රතිපාදන (In put) හා ප්‍රතිඵලය (Out come) ඇතුලත්කර 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයෙකු පත් කරනු ලැබිය යුතු වුවත්, 2015 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

5.2 විගණන හා කළමනාරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවත්, 2015 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

2025 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 15 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 10 ක් ද වූ අතර ඒ අනුව ද්විතීය මට්ටමේ පුරප්පාඩු 05 ක් පැවතුණි. එමෙන්ම ජොෂ්ඨ මට්ටමේ ලේකම් තනතුර හා ගණකාධිකාරි තනතුර සඳහා 2016 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දින දක්වාම වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් අනුයුක්ත කර තිබුණි.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4. කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
1. සැලසුම්කරණය හා පුහුණුව			
1.1 වාර්ෂික සැලැස්ම සකස් කිරීම	100%		
1.2 ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම		80%	
1.3 කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා පුහුණුව ලබාදීම	90%		
2. සීමා නිර්ණය කාර්යයන් සඳහා අවශ්‍ය වන තොරතුරු එක් රැස් කිරීම			
2.1 පරිපාලන කොට්ඨාස මායිම් නිශ්චිතව දක්වා නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල පරිපාලන මායිම් නිශ්චිත කර ගැනීම සඳහා ලිපි යැවීම.	100%		
2.2 ජන හා නිවාස සංගණන තොරතුරු ලබා ගැනීම2025/2024		75%	
2.3 ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ප්‍රතිඵල කොට්ඨාස මට්ටමින් රැස් කිරීම.		85%	
3. සීමා නිර්ණය සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීම.			
3.1 සීමා නිර්ණය සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුම්වත් කිරීමට අත් පොත් 04ක් මුද්‍රණය කිරීම		75%	
4. වර්තමානයට ගැළපෙන වාර්තා / ලේඛනාගාරයක් සකස් කිරීම හා ලේඛනවල මෘදුකාංග පිටපත් සකස් කිරීම		75%	

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
-	-	-	-	-	-

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් කොමිෂන් සභාව වෙත කාර්ය භාරයන් පවරා නොමැති වීම මත නිශ්චිතව තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම දුෂ්කර විය. එසේ වුවද කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර අනුව හඳුනා ගන්නා ලද ශ්‍රී ලාංකික ජන සමාජය වෙත, සවිමත් යටිතල පහසුකම් ගෙඩනැගීම සඳහා සහ ජාතික සංවර්දන කටයුතු සඳහා දිවයිනේ පළාත් පාලන ආයතන වල මායිම් (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා), පරිපාලන කොට්ඨාස සීමා (පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිලධාරී කොට්ඨාස) සහ අධ්‍යාපන, පොලිස්, අධිකරණ, සෞඛ්‍ය, ගොවිජන ආදී බල ප්‍රදේශවල සීමා ඒක මිතිකව සිදු කිරීම සඳහා අවශ්‍ය දත්ත එක් රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම මඟින් තිරසාර සංවර්ධන අරමුණු කරා ගමන් කිරීම උදෙසා සිය සම්පත් මෙහෙයවීම සිදු කර ඇත.

6. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරෙන කාර්ය භාරයේ භාරදූරත්වය සලකා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ 2016.02.05 දිනැති අංක DMS/1029 දරන ලිපියෙන් පහත සඳහන් පත්වීම් අනුමත කර ඇත.

තනතුර	මට්ටම	තනතුරු සංඛ්‍යාව	වැටුප් කේතය
ලේකම්	ජ්‍යෙෂ්ඨ	01	SL-3-2006
ගණකාධිකාරි	ජ්‍යෙෂ්ඨ	01	SL-1-2006
සම්බන්ධීකරණ ලේකම්	තෘතියික	01	රා.පරි.ච. 6/2006
පරිපාලන නිලධාරි	තෘතියික	01	MN-7-2006
භාෂා පරිවර්තක	ද්විතියික	03	MN-6-2006
තොරතුරු තාක්ෂණ සහකාර	ද්විතියික	02	MT-1-2006
රාජ්‍ය කළමනාකරණ සහකාර	ද්විතියික	02	MN-2-2006
රියදුරු	ප්‍රාථමික	02	PL-3-2006
කාර්යාල සහයක	ප්‍රාථමික	02	PL-1-2006
එකතුව		15	

මෙම වර්ෂය තුළ පහත සඳහන් පත්වීම් සිදුකර ඇත.

- ලේකම් තනතුරෙහි වැඩ බැලීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අතිරේක සර්වේයර් ජනරාල් (පාලන හා මානව සම්පත්) අනුර මුතුමාල මහතා 2025.02.21 දින සිට 2025.07.24 දින දක්වා (විශ්‍රාම දිනය දක්වා) කාලයටපත් කර ගන්නා ලදී. 2025.07.25 දින සිට වසරක කාලයක් සඳහා හෝ දැනට පුරප්පාඩුව පවතින ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කර ගන්නා දිනය දක්වා හෝ යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි, මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන) බී.පී.සී.කුලරත්න මහතා ලේකම් තනතුරෙහි වැඩ බැලීම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් පත් කර ගන්නා ලදී.
- ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව නිත්‍ය තනතුරේ රාජකාරී වලට අමතරව, 2024.07.01 දින සිට වසරක කාලයක් සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ගණකාධිකාරී ලෙස රාජකාරී සිදු කළ ගණකාධිකාරී ඊ.ජී.එස්.සිසිර කුමාර මහතා පත් කර ගන්නා ලදී.ඉන් පසුව 2025.07.01 දින සිට 2026.06.30 දක්වා වසරක කාලයක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව, නැවත වරක් ඊ.ජී.එස්.සිසිර කුමාර මහතා ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ගන්නා ලදී.

මේ අනුව2025.12.31 දින වන විට සේවා නියුක්තිය පහත පරිදි වේ.

තනතුර	මට්ටම	අනුමත	පුරවන ලද	පුරප්පාඩු
ලේකම්	ජ්‍යෙෂ්ඨ	01	01[a]	-
ගණකාධිකාරි	ජ්‍යෙෂ්ඨ	01	01[a]	-
සම්බන්ධිකරණ ලේකම්	තෘතියික	01	01	-
පරිපාලන නිලධාරි	තෘතියික	01	01	-
භාෂා පරිවර්තක	ද්විතියික	03	0	03
තොරතුරු තාක්ෂණ සහකාර	ද්විතියික	02	0	02
රාජ්‍ය කළමනාකරණ සහකාර	ද්විතියික	02	02	-
රියදුරු	ප්‍රාථමික	02	02	-
කාර්යාල කාර්ය සහයක	ප්‍රාථමික	02	02	-
එකතුව		15	10	05

a - වැඩ බලන

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ	-	-
1.6	වෙනත්	අදාල නොවේ	-	

2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)			
2.1	රා.ප.ච.267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අදාල නොවේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහාභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අදාල නොවේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

3	මූල්‍ය පාලන සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර කිරීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-

4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ	-	-

6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ.134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අදාල නොවේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අදාල නොවේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.	අදාල නොවේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අදාල නොවේ	-	-

7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අදාල නොවේ	-	-

8	වත්කම් කළමනාකරණ			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එමචක්‍රලේඛයේවිධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රා.මු.ච. අංක5/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ	-	-

9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අදාල නොවේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 සහ 110 ප්‍රකාරව,කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රා.ප.ච. 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීමනැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අදාල නොවේ	-	-

10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නිමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට ඒම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-

11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල වේ	-	-

12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අදාල නොවේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අදාල නොවේ	-	-

13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාල නොවේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කැ පවත්වාගෙන යාම.	අදාල නොවේ	-	-

14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාර පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-

15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදුකොට තිබීම.	අදාල නොවේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අදාල නොවේ	-	-
15.3	මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාල නොවේ	-	-

16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත්කර තිබීම.	අනුකූල නොවේ	තොරතුරු දැන ගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව මේ වසරේ කිසිවෙකුත් තොරතුරු ඉල්ලා නැත.	-

18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රා.ප.ච. අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අදාල නොවේ	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී පඥප්තිය සම්පාදය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අදාල නොවේ	-	-

19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රා.ප.ච.අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ	අප ආයතනය පුහුණු වැඩසටහන් සම්පාදනය නොකරන අතර බාහිර ආයතන මඟින් සුදුසු අවස්ථා ලබා ගනී.	සුදුසු පරිදි පුහුණු වැඩසටහන් කරා යොමු කිරීම.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීමනිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර කොට තිබීම.	අනුකූල වේ	-	-

20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ	-	-